# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2281/23 - 2022 මැයි මස 25 වැනි බදාදා - 2022.05.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66 (අ) (1) වගන්තිය යටතේ මඩකලපුව මහ නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන මඩකලපුව මහ නගර සභාවේ තෝරාඑවා ඇති සභිකයකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද,

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ මඩකලපුව මහ නගර සභාවේ තෝරාඑවා ඇති සභිකයෙකු ලෙස පත් වූ සිවරාසා සිවරාජ් අයත් වන්නා වූ තමිළ් මක්කල් විඩුදලෛප් පුළිකල් නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරාපත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම මඩකලපුව මහ නගර සභාවේ තෝරාඑවා ඇති සභිකයෙකු පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද,

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා රවීන්ද්‍රන් හරිප්‍රසාත් නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද,

මඩකලපුව මහ නගර සභාවේ තේරීම් භාර නිලධාරී, මුහෙයියදීන් බාවා මුහම්මදු සුෆ්යාන් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ (1) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් රවීන්ද්‍රන් හරිප්‍රසාත්, මඩකලපුව මහ නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

**එම්. බී. එම් සුෆ්යාන්,**
තේරීම් භාර නිලධාරී,
මඩකලපුව මහ නගර සභාව.

2022 මැයි මස 24 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මඩකලපුව.

EOG 05 - 0117

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66(අ)(1) වගන්තිය යටතේ කාත්තන්කුඩි නගර සභා- වේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොටගෙන කාත්තන්කුඩි නගර සභාවේ තෝරාඑවා ඇති සභිකයකුගේ ධුරයක් පුරප්පාඩු වූ වී ඇති හෙයින් ද,

ඉහත කී ආඥාපනතේ 66(අ)(1) වගන්තිය යටතේ කාත්තන්කුඩි නගර සභාවේ තෝරාඑවා ඇති සභිකයෙකු ලෙස පත් වූ පීර් මුහම්මදු අමීර් අලි අයත් වන්නා වූ මුස්ලිම් ජාතික සන්ධානය නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරාපත්කර ගනු ලැබිය යුතු යැයි, ප්‍රකාශ කරනු ලැබිය යුතු වූද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම කාත්තන්කුඩි නගර සභාවේ තෝරාඑවා ඇති සභිකයෙකු පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද,

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා මුහම්මදු මුස්තෆා මුහම්මදු ආරිෆ් නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද,

කාත්තන්කුඩි නගර සභාවේ තේරීම භාර නිලධාරි, මුහෙයියදීන්, බාවා මුහම්මදු සුෆ්යාන් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66(අ)(1) වගන්තිය ප්‍රකාර ක්‍රියාකරමින් මුහම්මදු මුස්තෆා මුහම්මදු ආරිෆ්, කාත්තන්කුඩි නගර සභාවේ තෝරාඑවා ඇති සභිකයෙකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

**එම්. බී. එම්. සුෆ්යාන්,**
තේරීම් භාර නිලධාරි,
කාත්තන්කුඩි නගර සභාව.

2022 මැයි මස 24 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මඩකලපුව දිස්ත්‍රික්කය.

EOG 05-0118